අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்லை, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 | +94112785818
info@moe.gov.lk | www.moe.gov.lk


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ යොමුව<br>எனது இல.<br>My Ref. | ED/02/29/10/0/8 II | ඔබේ යොමුව<br>உமது இல.<br>Your Ref. | | දිනය<br>திகதி<br>Date | 2019.02. 25 |

චක්‍රලේඛ අංකය : 07/2019

සියලුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්
සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්

**<u>ගුරුපත්වීම් විෂයය වෙනස් කිරීම</u>**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1885/38 හා 2014.10.23 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශිත ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථාවේ 7 වන වගන්තියේ විධිවිධාන පරිදි ජාතික හා පළාත් පාසල්වල, එක් එක් විෂයන් යටතේ පවතින පුරප්පාඩු සංඛ්‍යාව මත සුදුසුකම්ලාභීන් ශ්‍රී ලංකා ගුරු සේවයට බඳවා ගනු ලැබේ.

02. අනුමත කාර්ය මණ්ඩලය තුළ විෂයානුබද්ධව පවතින පුරප්පාඩු සඳහා විධිමත් ක්‍රමවේදයකට අනුව බඳවා ගන්නා ලද ගුරුභවතුන්ගේ පත්වීම් ලිපියෙහි විෂයය වෙනස් කිරීම සමස්ත අධ්‍යාපන පද්ධතියේ ගුරු තුලනය කෙරෙහි අයහපත් බලපෑම් ඇති කරනු ලබයි.

03. එබැවින්, ගුරුභවතුන්ගේ පත්වීම් ලිපියේ සඳහන් විෂයය ප්‍රතිපත්තිමය වශයෙන් කිසිසේත් වෙනස් නොකරන බැවින්, ඒ සඳහා ඉල්ලීම් ඉදිරිපත් නොකළ යුතු අතර, ඒ සම්බන්ධව විදුහල්පතිවරුන් හා සියලුම ගුරුභවතුන් දැනුවත් කරන ලෙස කාරුණිකව දන්වමි.

04. පාසලෙහි පවතින සේවා අවශ්‍යතාවය මත පත්වීම් ලිපියෙහි සඳහන් විෂයට පරිබාහිරව ගුරුභවතාගේ හැකියාව හා කැමැත්ත මත කාලච්ඡේද කිහිපයක් වෙනත් විෂයයක් ඉගැන්වීම සඳහා යෙදවීමට මෙම උපදෙස් බලපෑමක් නොවන බව ද දන්වනු කැමැත්තෙමි.

පද්මසිරි ජයමාන්න
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය